# [08]
# ශ්‍රී ලංකාවේ වෘත්තිය සමිති ව්‍යාපාරය හා නායකත්වය

එම්. එම්. ඩී. කේ. කුමාර, එස්. ඒ. ඇල්ලෙපොළ, එච්. ඒ. ආර්. එම්. පොන්සේකා,
එම්. ආර්. එස්. කේ. නිශ්ශන්ක, ජේ. එ. අයි. මදුෂිකා

**හැඳින්වීම**

ඈත අතීතයේ ස්වයංපෝෂිත ආර්ථික රටාවෙන් ජීවත් වූ සමාජ ව්‍යුහයක් පැවතීම හේතු කොට ගෙන තමාගේ කටයුතු තමා විසින්ම සිදුකර ගන්නා ලදහ. ඒ සඳහා වෙනත් පාර්ශ්වයක උපකාර ලබාගැනීමක් සිදු නොවුනි. එසේ සිදු වුව ද එය හුදෙක්ම ප්‍රතිලාභයක් අපේක්ෂා නොවූ උපකාරයක් පමණක් ම විය. නමුත් වැඩවසම් යුගය හා කාර්මික විප්ලවය වැනි කරුණු හේතු කොට ගෙන පුද්ගලයන් කණ්ඩායම් වශයෙන් විවිධාකාර වූ රැකියාවල යෙදීමට පෙළඹුනි. මෙසේ කණ්ඩායම් ආකාරයට රැකියා කිරීමේ දී ශ්‍රමිකයන්ට තම පාලන පක්ෂ වලින් විවිධාකාර දුක් ගැහැට විඳීමට සිදු විය. මෙම පාලක පක්ෂයෙන් සිදු වන පීඩා අවම කර ගැනීමට කණ්ඩාමක් ලෙස තම ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට පුද්ගලයන් සංවිධානය වීම සිදු වන ලදහ. අතීතයේ සිදු කළ මෙම සංවිධානය වීම නූතන වෘත්තිය සමිති වල මූලාරම්භය විය. මෙසේ පුද්ගලයන් සංවිධානය වීමට හේතු වන මූලික කරුණු ලෙස වැඩි ආර්ථික වාසි අත් කර ගැනීම, රැකියා තත්ත්වයන් උසස් කර ගැනීමට, රැකියා සුරක්ෂිතතාවය සලසා ගැනීම, කාර්මික නිදහස අත්කර ගැනීම, සේවා කොන්දේසි වලට පවතින අසාධාරණභාවයට එරෙහි වීම සහ වෙනත් විවිධ හේතු බලපාන ලදහ.

ශ්‍රී ලංකාව තුළ වෘත්තිය සමිති බිහි වීමට මූලික හේතුවක් ලෙස සැලකිය හැක්කේ දකුණු ඉන්දියානු වතු කම්කරු දමිළ ජනතාවගේ ආගමනයයි. ඔවුන්ට තමාගේ අයිතිවාසිකම් දිනා ගැනීමට මහගු අස්වැසිල්ලක් වුයේ මෙම වෘත්තිය සමිති ක්‍රමයයි.

1935 අංක 14 වෘත්තිය සමිති ආඥා පනතට අනුව වෘත්තිය සමිතියක් යනු ''ස්ථිර හෝ තාවකාලික සේවාදායකයන් හෝ සේවා යෝජකයන්ගෙන් සමන්විත සංවිධානයක් හෝ එකමුතුවකි.'' මෙසේ ගොඩනැගෙන ඕනෑම වෘත්තිය සමිතියක සාර්ථකත්වය තීරණය වන්නේ එම වෘත්තිය සමිතියට සපයනු ලබන නිවැරදි මග පෙන්වීම අනුවයි. එනම් නිවැරදි නායකත්වය අනුවයි. යහපත් සාර්ථක වෘත්තිය සමිතියක් පිටුපස සිටිනු ලබන්නේ ඵලදායී වෘත්තිය සමිති නායකත්වයයි. සාර්ථකත්වය උදෙසා බලපානු ලබන වෘත්තීය සමිති නායකත්වය අප පරිචය තුළ ක්‍රියාත්මක වන ලද ආකාරයේ පිළිබඳ විමසුමක් මෙම ලිපියෙන් ඉදිරිපත් කරනු ලබයි.

**වෘත්තිය සමිති නායකයා යනු කවරකුද?**

ව්‍යාපාර සංවිධානයක අරමුණු සඵල කර ගැනීමට නම් තෘප්තිමත් හා යෝග්‍ය සේවක පිරිසක් සිටිය යුතු අතර එවැනි සේවක පිරිසක් බිහි වීමට නම් සාර්ථක වෘත්තිය සමිතියක් පැවතිය යුතුය. මෙවැනි සාර්ථක වෘත්තිය සමිතියක් බිහිවීමට නම් තම අනුගාමිකයන්ගේ ඕනෑ එපාකම් මනා ලෙස හඳුනා ගනු ලැබූ දක්ෂ අතිසාර්ථක වෘත්තිය සමිති නායකයකු සිටිය යුතුය. මෙ මගින් පැහැදිලි වන මූලික කරුණ නම් ව්‍යාපාර සංවිධානයක අරමුණු ඉටු කර ගැනීම සඳහා සාර්ථක වෘත්තිය සමිති නායකත්වයක් අත්‍යවශය බවයි.

වෘත්තිය සමිති නායකයකු යනුවෙන් සරලව පැහැදිලි කළහොත් තම අනුගාමිකයන්ගේ සේවා හා අනෙකුත් අපේක්ෂාවන්, බලාපොරොත්තු සාර්ථකව ඉටුකරමින් සංවිධානයේ යහපත උදෙසා අනුගාමිකයන් මෙහෙයවන පුද්ගලයෙකි. එම පුද්ගලයාගේ අන්තර පුද්ගල සම්බන්ධතා ඔහු සතු විශේෂිත දක්ෂතා හා නායකත්ව ගුණාංග මත වෘත්තිය සමිති සාර්ථකත්වය රඳා පවතියි.

**වෘත්තිය සමිති නායකත්ව විකාශය**

ශ්‍රී ලංකාව තුළ සේවකයන් වෘත්තිය සමිති ලෙස ඒකරාශි වීමට පටන් ගෙන ඇත්තේ මීට වසර 150 ට පමණ පෙර ඈත වකවානුවේදීය. පෘතුගීසි පාලන කාලය තුළත් ලන්දේසි පාලන

කාලය තුළත් ක්‍රියාත්මක නොවූ මෙම වෘත්තිය සමිති ව්‍යාපාර ලංකාව තුළ ආරම්භ වන්නේ ඉංග්‍රිසි ආණ්ඩු කාලය තුළයි. මෙයට ප්‍රධාන සාධකයක් ලෙස සඳහන් කළ හැක්කේ පෙර සඳහන් කළ පරිදිම ඉංග්‍රිසි ජාතිකයන්ගේ කාර්යය පහසුව සඳහා ගෙන්වන ලද දකුණු ඉන්දියානු ද්‍රවිඩ කම්කරු ජනතාවයි. නමුත් අතීතයේ පළමු වෘත්තිය අරගලය ලෙස සඳහන් කළ හැක්කේ තර්ස්ටන් නැමැත්තෙකු විසින් පවත්වාගෙන ගිය කාර්මික පාසලක වඩුවන් හා ගුරුවරුන් විසින් තමන් හට නම්බුකාර තත්වයක් ආණ්ඩුව ලබා නොදීමට එරෙහිව සිදු කළ අරගලයයි (Kottawatta, 2008). මෙසේ ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වූ වෘත්තිය සමිති අරගලයන් 1900 පමණ කාලය වන විට ඉතා විශාල ලෙස වර්ධනය වී ඇත. මෙසේ පුළුල් වූ වෘත්තිය සමිති ව්‍යාපාරයට අතීතයේ සිට වර්තමානය දක්වා ලබා දුන් නායකත්වයන් පිළිබඳව දළ අදහසක් අපට පහත සටහනින් ලබා ගත හැක.

ඉහත වෘත්තිය සමිති අරගල හා ඒවා මෙහෙය වූ නායකයන් දෙස බැලීමේ දී ප්‍රධාන කරුණු දෙකක් සම්බන්ධව අවධානය යොමු කළ හැක. එයින් එක් කරුණක් වනුයේ මෙම වෘත්තිය අරගල වලින් වැඩි ප්‍රමාණයක් වතු කම්කරුවන් ආශ්‍රිතව ඇති වූ අරගල වේ. එනම් දකුණු ඉන්දිය ද්‍රවිඩ ජනතාවගේ අයිතින් වෙනුවෙන් සිදු කළ අරගල වේ. මෙයින් පෙන්නුම් කරනු ලබන අනිකුත් ප්‍රධාන කරුණ වනුයේ අදාල වෘත්තිය සමිති අරගලයන් මෙහෙවා ඇත්තේ වෘත්තිය සමිතියට බාහිර දෙවන පාර්ශවයක් විසින් බවයි. එනම් නායකත්වය පිටස්තර පුද්ගලයන් විසින් දරනු ලබන බවයි. වර්තමානයේ ද මෙය මෙලෙස ම පවතින අතර සමස්ත ලංකා සුව සේවා සංගමයේ සභාපති ධුරය පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියන් දැරීම ම මෙයට කදිම නිදසුනකි. මෙසේ දෙවන පාර්ශවයක් මැදිහත් වීමට මූලික හේතුව ලෙස සැලකිය හැක්කේ වෘත්තිය සමිති සඳහා දේශපාලන මුහුණුවරක් පැමිණිම හා දේශපාලන ඇඟිලි ගැසීම්ය. මීට අමතරව, යටත් විජිත භාවයට විරෝධය දැක්වීමට හා රටට නිදහස ලබා ගැනීමට දෙවන පාර්ශවයකට සහයෝගය ලබා දීම (1948 ට පෙර), වෘත්තිකයන් සතු අඩු දැනුම හා අධ්‍යාපන මට්ටමක් නොමැති කම ද ප්‍රධාන හේතුවකි (උදාහරණයක් ලෙසට රෙදි අපුල්ලන්නන්, කරත්තකරුවන්, මුද්‍රණ කම්කරුවන්ගේ වෘත්තීය සමිති දැක්වීමට හැකිය), වෘත්තිකයන් සතුව නායකත්ව කුසලතා හා හැකියාවන් මඳ කම හා සංවිධාන කටයුතු ශක්තියක් නොමැති කමයි (Kottawatta, 2008).

ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරය සහ නායකත්වයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ව අවබෝධයක් ලබාගැනීම සඳහා 2008 දී කෝට්ටවත්ත විසින් ඉදිරිපත් කළ සටහනක් පහත වේ.

| වර්ෂය | වැඩවර්ජනය | නායකත්වය |
|---|---|---|
| 1893.09.12 | කොළඹ කේව් සමාගමේ මුද්‍රණ සේවකයින් 50 ක් පමණ | ජී. බුල්ජන්සි හා ලිස්බෝ පින්තු මහත්වරුන් |
| 1896.07.01 | කොළඹ රෙදි අපුල්ලන්නන් | හෙක්ටර් වැන් කුයිලන් බර්ග් හා ඩී. බී. ඒකනායක දේවගැතිතුමා |
| 1898.01 | කොළඹ වරායට සම්බන්ධ කරත්තකරුවෝ | ජෝන් කොතලාවල මහතා |
| 1920.03.20 | කොළඹ වරායේ කම්කරුවෝ 5000 ක් | ලංකා කම්කරු සංගමය |
| 1926.08 | වැල්ලවත්ත රෙදි මෝලේ සේවකයින් | ඒ. ඊ. ගුනසිංහ මහතා |
| 1933.02 | වැල්ලවත්ත රෙදි මෝලේ කම්කරුවන් 1400ක් පමණ | කොල්වින් ආර්. ද සිල්වා මහතා |
| 1933.09 | කොළඹ නගරයේ ගෝල්පෙස් හෝටලයේ වැඩ වර්ජනයක් | ඒ. ඊ. ගුනසිංහ මහතා |
| 1937.09 | වැල්ලවත්ත රෙදි මෝල | සමසමාජ පක්ෂය |
| 1938 | කොළඹ රුදිගු බස් සමාගමේ කම්කරුවන් | සමසමාජ පක්ෂය |
| 1990.02.16 | පස්සර වත්ත | L.J.E.W. |
| 1990.02.21 | තෙල්බැද්ද වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.03.03 | පාමස්ටන් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.03.05 | උණුගල්ල වත්ත | එක්සත් වතු කම්කරු සංගමය |

| | | |
|---|---|---|
| 1990.03.06 | ලිසිකැලේ වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.03.12 | හයිලන්ඩ් වත්ත | වතු සේවා සංගමය |
| 1990.04.03 | රොසට් වත්ත | ලංකා ජාතික වතු කම්කරු සංගමය |
| 1990.04.04 | රොස්ක්‍රියා ඒ වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.04.21 | තෙල්බැද්ද වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.05.03 | එල්ලාවල වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.05.14 | නන්ද හේන වත්ත | ලංකා වතු කම්කරු සංගමය |
| 1990.05.18 | ශාන්ත ජේම්ස් වත්ත | ලංකා ජාතික වතු කම්කරු සංගමය |
| 1990.05.17 | මුරුත්තාත්ත වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.05.25 | පස්සර වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.06.06 | හිගුරන්ත වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.06.12 | දික්වැල්ල වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.06.13 | ලෝගි වත්ත | ලංකා ජාතික වතු සංගමය |
| 1990.06.28 | කැරොලිනි වත්ත | ලංකා වතු කම්කරු සංගමය |
| 1990.07.03 | අශෝකා වත්ත | ලංකා වතු කම්කරු සංගමය |
| 1990.07.03 | ග්ලිස්ගේම් වත්ත | ලංකා වතු කම්කරු සංගමය |
| 1990.07.22 | ලොකන්ට වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.08.02 | ටොරින්ටන් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.08.08 | හෝම්බුස් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.08.09 | කැටවල වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.08.20 | බින්ධන ඒ වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.08.22 | හැරෝ වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.09.05 | දරවල වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.09.17 | මැල්ටෙනිල් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.10.08 | මිල්කැන්ට්‍රි වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.10.30 | ස්ටොන්ක්ලිප් වත්ත | ලංකා වතු කම්කරු සංගමය |
| 1990.11.07 | ලබුකැලේ රාජ්‍ය වතුයාය | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.12.05 | මාවුසා කැලේ වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.12.06 | බඹර කැලේ වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.12.08 | මැල්මෝලේ වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.12.17 | වටවල වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.12.18 | මහරාජා වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1990.12.26 | ඩෙල්මා වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1991.02.11 | කෙබ්රටන් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1991.03.04 | හැද්රලි රාජ්‍ය වතුයාය | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1991.03.12 | ඇගිල්ල වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1991.03.13 | බබර කැලේ වත්ත | කඳුරට කම්කරු පෙරමුණ |
| 1991.04.03 | ගෝතපිටිය වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1991.04.25 | රිල්හේන රාජ්‍ය වැවිල්ල | C.W.C |
| 1991.05.04 | නෙළුම්කැලේ වත්ත | C.W.C |
| 1991.05.06 | වෙස්ට්හෝල් වත්ත | C.W.C |
| 1991.05.31 | ලපකැලේ වත්ත | ලංකා වැවිලි ක.ස. |
| 1991.06.04 | වෙරළුගොල්ල වත්ත | ලංකා වැවිලි ක.ස. |
| 1991.06.11 | මැද්දෙ කන්ද රාජ්‍ය වැවිල්ල | ලංකා වතු කම්කරු සංගමය |
| 1991.06.19 | සන්ට්වත්ත - වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1991.06.19 | ගැටමෝර වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1991.06.20 | හැද්රලි රාජ්‍ය වැවිල්ල | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1991.07.01 | ටෙම්පල් ස්ටෝ වත්ත | L.J.S.L.C. |

| | | |
|---|---|---|
| 1991.07.01 | ගලතුර රාජ්‍ය වැවිල්ල | C.W.C. |
| 1991.07.03 | කඩියන්ලෙන වත්ත | C.W.C. |
| 1991.07.10 | රදැල්ල වත්ත | C.W.C. |
| 1991.08.09 | මහරාජා වත්ත | C.W.C. |
| 1991.08.14 | ෆොලෝරල් ග්‍රීන් වතුයාය | C.W.C. |
| 1991.08.19 | අතික් වත්ත | C.W.C. |
| 1991.08.20 | ඔස්බෝන් වත්ත | C.W.C. |
| 1991.09.04 | ග්ලේන් මිල්ට් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1991.09.07 | මිලරි වත්ත | C.W.C. |
| 1991.09.16 | කැම්බියන් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1991.09.20 | මධධජ වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1991.10.02 | ඕල්ටන් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1991.10.11 | ලෙනන්ට් වත්ත | ලංකා ජාතික සංගමය |
| 1991.10.14 | ඔස්බෝන් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1991.11.08 | මට්ටකැලේ වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1991.11.09 | ගලබඩ රාජ්‍ය වැවිල්ල | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1991.11.12 | බුල්ෆිල්ඩ් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1991.12.05 | කොන්කෝඩියා වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1991.12.24 | සන්ට්ක්ලෙයාර් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1991.12.30 | යටබේරිය වත්ත | LJWU |
| 1992.01.02 | පැල්මඩුල්ල රාජ්‍ය වැවිල්ල | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.01.29 | වුඩ්එන්ඩ් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.02.06 | කැලේ වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.02.13 | පොයින්ටන් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.02.18 | මරේ වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.03.01 | අටාල වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.03.08 | ඩෙස්ටර්පෝඩ් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.03.11 | වුමන් බී වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.04.01 | පැලවත්ත රාජ්‍ය වැවිල්ල | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.04.07 | වටවල බී වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.04.18 | ගලබඩ රාජ්‍ය වැවිල්ල | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.04.21 | රොසයින් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.05.04 | ආගයිල් ඒ වත්ත | කම්කරු ජාතික සංගමය |
| 1992.05.25 | වටගොඩ වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.05.27 | සවුත් වනරාජා පී වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.06.02 | කොම්ප්‍රඩ් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.06.03 | ලෙනන්ට් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.06.15 | ග්‍රේට් වෙස්ටන් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.06.18 | රංගල ඩක්වාරි රාජ්‍ය වතුයාය | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.07.06 | ඇබොඩ්ස්ලි වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.07.09 | ඩෙල්මා වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.07.20 | හිල්ඩන්පෝල් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.07.23 | අඩක්පිටිය වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.08.03 | පුට්වල් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.08.08 | යුලිෆිල්ඩ් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.08.08 | ලිපකැලේ වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.08.14 | ග්ලෙක්ට්ල් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.09.03 | බඹරකැලේ වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.09.09 | කැටබුලා වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |

| | | |
|---|---|---|
| 1992.09.19 | කිඩ් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.09.21 | වෙන්ඩර් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.10.10 | බ්‍රාන්ස් වින් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.10.16 | බිලින්ක්බාකි වත්ත | කම්කරු ජාතික සංගමය |
| 1992.10.16 | රනොාව වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.11.04 | බිලින්ක්බෝකි වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.11.05 | ක්‍රෝග්ලි වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.11.14 | කොටියාගල වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1992.12.04 | බිලින්ත් බෝනි වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1993.01.12 | හැද්රලි වතුයාය | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1993.01.22 | වෙස්ට්හෝල් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1993.01.25 | ග්‍රීන් ගෲප් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1993.01.27 | මතුරට ගෲප් | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1993.02.07 | කලත ගෲප් | CWC |
| 1993.02.11 | තල්දූව වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1993.02.26 | ග්ලානෝර් වත්ත | CWC |
| 1993.03.03 | නිප් චැලේ රාජ්‍ය වතුයාය | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1993.06.12 | බෙන්තොට වතුයාය | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1993.06.12 | ගුළුගහකන්ද වතුයාය | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1993.06.12 | මාපලගම වතුයාය | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1993.06.12 | දීපතුරු වතුයාය | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1993.08.02 | වත්තෙගෙදර වත්ත | එක්සත් ස්වාධීන වෘත්තීය සමිතිය |
| 1993.08.02 | මිරිස්හේන වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1993.10.14 | හයිඩ්‍රි වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1993.11.02 | මඩුල් කැලේ වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 1996.01.07 | ලෝගි වත්ත, තලවකැලේ | CWC |
| 1996.02.06 | ගල්බඩවත්ත, රත්නපුර | CWC |
| 1996.03.05 | ඔයගන වෙස්ට් වත්ත | CWC |
| 1997.03.16 | ග්ලැෂෝ වත්ත | එක්සත් ලංකා වතු කම්කරු සංගමය |
| 1997.06.28 | බෲක් සයිඩ් ගෲප් | ලං.ව.ක.කො. |
| 1998.01.07 | කුවින්ස් බේරි වත්ත | කඳුරට කම්කරු පෙරමුණ |
| 1998.01.09 | කුවින්ස් බේරි වත්ත | කඳුරට කම්කරු පෙරමුණ |
| 1998.01.19 | හැරින්ටන් වත්ත | CWC |
| 1998.02.05 | දීප ව්‍යාප්ත වතු | CWC |
| 1998.02.20 | ඔඩින්ටන් වත්ත | කඳුරට කම්කරු පෙරමුණ |
| 1998.03.01 | වෙදමුල්ල වත්ත | CWC |
| 1998.03.11 | වියටන් වත්ත | CWC |
| 1998.03.11 | ලෝවබෙවරිය වත්ත | CWC |
| 1998.03.16 | ඇන්ෆීල්ඩ් වත්ත | CWC |
| 1998.05.24 | ශාන්ත ජේම්ස් වත්ත | |
| 1998.05.26 | ඔස්බෝන් වත්ත | CWC |
| 1998.05.26 | ඇග්‍රස් ලැන්ඩ් වත්ත | CWC |
| 1998.06.15 | මල්වත්ත වත්ත | CWC |
| 1998.06.26 | දෙරකල්ඔය වත්ත | CWC |
| 1998.07.06 | ලැවන්ට් වත්ත | CWC |
| 1998.07.27 | රිල්හේන වත්ත | CWC |
| 1998.08.11 | ඕපාත වත්ත | ලං.කම්.කොංග්‍රසය |
| 1998.08.12 | පෝරණුව වත්ත | CWC |

| | | |
|---|---|---|
| 1998.9.04 | පීඩ්‍ය වත්ත | ලංකා ජාතික වතු කම්කරු සංගමය |
| 1998.09.08 | වැවිලි වත්ත | ලං.ජා.වතු කම්කරු සංගමය |
| 1998.09.09 | පලුගස්වැව වත්ත | ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය |
| 1998.10.30 | පලුගස්වැව වත්ත | ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය |
| 1998.11.04 | වලහපිටිය වත්ත | ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය |
| 1998.11.10 | සපුමල් කන්ද වත්ත | ලං.ජා.වතු කම්කරු සංගමය |
| 1998.11.10 | පිල්හේන වත්ත | එක්සත් ලංකා වතු කම්කරු සමිතිය |
| 1998.12.04 | පැල්මඩුල්ල වත්ත | ලං.ජා.වතු කම්කරු සංගමය |
| 1998.12.15 | අලකොල්ල වත්ත | CWC |
| 1998.12.17 | බෝමන්ට් වත්ත | CWC |
| 1998.12.11 | සපුගස්තැන්න වත්ත | එක්සත් ලංකා වතු කම්කරු සමිතිය |
| 1999.01.03 | පටුපාවල වත්ත | CWC |
| 1999.01.11 | ලිප්ස් ඩේලි ගෘප් | CWC |
| 1999.03.23 | එක්ස්ඩේල් වත්ත | CWC |
| 1999.03.24 | ඌරුමීවල වත්ත | CWC |
| 1999.04.06 | බේරුබැවිල වත්ත | ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය |
| 1999.04.10 | ඇඳුරාපොල වත්ත | ADWC |
| 1999.04.28 | බෙන්තොට වතුයාය | ශ්‍රී ලංකා.ජා.වතු.සං. |
| 1999.05.17 | එක්ස්ඩේල් වත්ත | NWW |
| 1999.05.17 | රාගල ගෘප් | CWC |
| 1999.05.17 | බාඩන්සයිඩ් ගෘප් | CWC |
| 1999.06.19 | වින්ස්ට් වත්ත | ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය |
| 1999.06.22 | බද්දේගම විලගොඩ වැලිවත්ත | ලං.ජා.වතු කම්කරු සංගමය |
| 1999.07.14 | ලබුකැලේ ගෘප් | CWC |
| 1999.08.11 | නුවරඑළිය වත්ත | CWC |
| 1999.08.02 | පෙන්රින් වත්ත | CWC |
| 1999.08.16 | කිරිපෝරුව වත්ත | CWC |
| 1999.09.17 | සිරිසිලිය වත්ත | මානව හිමිකම් සුරැකීමේ රුහුණු සංවිධානය |
| 1999.09.20 | පොඩිහේන් වත්ත | CWC |
| 1999.10.16 | බෙවර්ලි වත්ත | ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය |
| 1999.11.23 | පනාවත්ත වතුයාය | CWC |
| 1999.12.17 | වොල්ප්මාර ගෘප් | CWC |
| 1999.12.20 | සෙන්ට් ලෙනාඩ් වත්ත | WWC |
| 2002.01.30 | ලංකා ප්ලාස්ටික් පැකේජ් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් | අන්තර් සේවක සංගමය |
| 2002.02.02 | සාන්කුවර් වත්ත | ලංකා කම්කරු එක්සත් පෙරමුණ |
| 2002.02.13 | ඇඳුරාපොල වත්ත | ලංකා ජාතික වතු කම්කරු සංගමය |
| 2002.02.14 | කියැංහාම් (ප්‍රයිවට් ලිමිටඩ්) | අන්තර් සමාගම් සේවක සංගමය |
| 2002.05.07 | ගාල්වො ජෙම්ස් (ප්‍රයි) ලිමිටඩ් | අන්තර් සමාගම් සේවක සංගමය |
| 2002.08.13 | තේ ශක්ති තේ කම්හල | ලංකා ජාතික වතු කම්කරු සමාගම් |
| 2002.08.29 | එල්ස්ටන් වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 2002.11.11 | හවුවේ වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 2003.01.27 | හල්පෙ වත්ත | ශ්‍රී ලංකා වතු කම්කරු සංගමය |
| 2003.07.31 | රොබේරියන් වත්ත | ලංකා කම්කරු එක්සත් පෙරමුණ |
| 2003.08.20 | ප්‍රීමා කම්හල් | අන්තර් සමාගම සේවක සංගමය |

| | | |
|---|---|---|
| 2003.08.08 | හුණුගල වත්ත | ලංකා කම්කරු කොංග්‍රසය |
| 2004.01.02 | පැලවත්ත සීනි සමාගම | අන්තර් සමාගම් සේවක සංගමය |
| 2004.02.08 | කිරිපෝරුවත්ත | ලංකා ජාතික වතු කම්කරු සංගමය |
| 2004.02.25 | යංග් ඉන් ලංකා (ප්‍රයි) ලිමිටඩ් | කඳුරට ජනතා කම්කරු සංගමය |
| 20004.07.10 | දෝකල්ඔය වත්ත | ලංකා ජාතික වතු කම්කරු සංගමය |
| 2004.09.02 | යටවත්ත | ලංකා ජාතික වතු කම්කරු සංගමය |
| 2005.01.27 | සී/ස මහනුවර බස් සමාගම | ශ්‍රී ලංකා ජාතික ප්‍රවාහනය සංගමය |
| 2005.02.18 | කුයිල් ගා වත්ත | ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය |
| 2005.05.13 | දයාන් ලංකා (ප්‍රයි) ලිමිටඩ් | අන්තර් සේවක සමාගම් සේවක සංගමය |
| 2005.06.16 | මහනුවර බස් කම්පැනි ලිමිටඩ් | ශ්‍රී ලංකා නිදහස් ජාතික සංගමය ඇතුළු කාර්මික, රියදුරු කො. සේ. සං. |
| 2005.07.14 | වෝඩින් වත්ත | අන්තර් සමාගම් සේවක සංගමය |
| 2005.09.06 | මල්කා රොප්ස් (පුද්) සමාගම | අන්තර් සමාගම් සේවක සංගමය |
| 2006.01.12 | යටිදූරිය වත්ත | ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය |

**නිගමනය**

ශ්‍රී ලංකාවේ වෘත්තිය සමිති නායකත්වය දෙස අතීතයේ සිට වර්තමානය දක්වා ම විශ්ලේෂණාත්මක ව බැලීමේදී ලබා ගත හැකි නිගමනයක් වනුයේ බහු වෘත්තිය සමිති ක්‍රමය පැවතීම නිසා හා දේශපාලන ඇඟිලි ගැසීම් අධික වීම නිසා වෘත්තියන්ට තම වෘත්තිමය අයිතින් සත්‍ය වශයෙන් ඉටු කර ගැනීම වෙනුවට පටු දේශපාලනික අරමුණු වෙනුවෙන් තම වෘත්තිය අයිතිවාසිකම් පාවා දීමට ගත් වෘත්තිය අයිතිවාසිකම් අත්හැර දැමීමට සිදු වී ඇති බවකි.

එනම් වෘත්තිය සමිති ව්‍යාපාරයට සිදුවී ඇත්තේ රට තුළ පවතින බල ලෝභී නින්දිත දේශපාලනයේ මුලික අතකොලුවක් බවට පත්වී ඒ ඒ දේශපාලන පක්ෂ වල ඕනෑ එපා කම් සපුරාලන හෙංචයියන් බවට පත්වීමටයි. මෙසේ දේශපාලන බලපෑම් වලට යටත් නොවී ස්වාධිනව ක්‍රියාත්මකව තම අයිතිවාසිකම් දිනාගැනීමට වෙර දරණ වෘත්තිය සමිති වලට වනුයේ පිට කොඳු බිදගත් නිවටයන්ගේ චරිතය නිරූපණය කිරීම පමණකි.

**ආශ්‍රිත ග්‍රන්ථ**

1. 1935 අංක 14 වෘත්තිය සමිති ආඥා පනත.
2. Kottawatta, KHH (2008). Review about the Sri Lankan Trade Unions Leaders, Author, Colombo.